**ශීර්ෂය - 217 පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුව**

**-----------------------------------------------------------------**

**1. මූල්‍ය ප්‍රකාශන**

**1.1 තත්ත්වාගණනය කළ මතය**

පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ 2020 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය ප්‍රකාශය, එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශවලින් සමන්විත 2020 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ විධිවිධාන සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 11(1) වගන්තිය ප්‍රකාරව පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් ඇතුළත් සම්පිණ්ඩන වාර්තාව 2021 අප්‍රේල් 06 වෙනි දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. විගණන පනතේ 11(2) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවට අදාළ වාර්ෂික විස්තරාත්මක කළමනාකරණ විගණන වාර්තාව 2021 අගෝස්තු 30 දින ගණන්දීමේ නිලධාරී වෙත නිකුත් කරන ලදී. ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(6) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 10 වගන්තිය ප්‍රකාරව මෙම වාර්තාව පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කරනු ලැබේ.

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2020 දෙසැම්බර් 31 දිනට පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තුවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය කාර්යසාධනය හා මුදල් ප්‍රවාහය පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**1.2 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 1.6 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදී. මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් මාගේ වගකීම, විගණකගේ වගකීම යන වගන්තියේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබා ගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.3 මූල්‍ය ප්‍රකාශය සම්බන්ධයෙන් ප්‍රධාන ගණන්දීමේ නිලධාරීගේ හා ගණන්දීමේ නිලධාරීගේ වගකීම

---

පොදුවේ පිළිගත් ගිණුම්කරණ මූලධර්මවලට අනුකූලව හා 2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 38 වගන්තියේ සඳහන් විධිවිධානවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිඹිබු කෙරෙන පරිදි මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම හා වංචා සහ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම ගණන්දීමේ නිලධාරීගේ වගකීම වේ.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුව විසින් වාර්ෂික හා කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වා ගෙන යා යුතුය.

ජාතික විගණන පනතේ 38(1)(ඇ) උප වගන්තිය ප්‍රකාරව දෙපාර්තමේන්තුවේ මූල්‍ය පාලනය සඳහා සඵලදායි අභ්‍යන්තර පාලන පද්ධතියක් සකස් කර පවත්වා ගෙන යනු ලබන බවට ගණන්දීමේ නිලධාරී සහතික විය යුතු අතර එම පද්ධතියේ සඵලදායිත්වය පිළිබඳව කලින් කල සමාලෝචනයක් සිදු කර ඒ අනුව පද්ධතිය ඵලදායි ලෙස කරගෙන යාමට අවශ්‍ය වෙනස්කම් සිදු කරනු ලැබිය යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය පිළිබඳ විගණකගේ වගකීම

---

සමස්ථයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා හා වැරදි හේතුවෙන් ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකාධිපති වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැම විටම ප්‍රමාණාත්මක සාවාද්‍ය ප්‍රකාශයන් අනාවරණය කර ගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇති විය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කර ගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම් හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන්, චේතනාන්විත මඟහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මඟ හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.
- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබා ගන්නා ලදී. .
- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය සහ අන්තර්ගතය සඳහා පැදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව ඇගැයීම.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව ගණන්දීමේ නිලධාරී දැනුවත් කරන ලදී.

**1.5 වෙනත් නෛතික අවශ්‍යතා පිළිබඳ වාර්තාව**

-----------------------------------------------

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 6(1)(ඈ) වගන්තිය ප්‍රකාරව පහත සඳහන් කරුණු මා ප්‍රකාශ කරමි.

(අ) මූල්‍ය ප්‍රකාශන ඉකුත් වර්ෂය සමඟ අනුරූප වන බවට,

(ආ) ඉකුත් වර්ෂයට අදාළ මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මා විසින් කර තිබුණු නිර්දේශ ක්‍රියාත්මක කර තිබුණි.

**1.6 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

---------------------------------------

**1.6.1 මූල්‍ය තත්ත්ව ප්‍රකාශය**

----------------------

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| **මූල්‍ය නොවන වත්කම්**<br>දේපල, පිරියත හා උපකරණ වටිනාකම මූල්‍ය තත්ත්වය පිළිබඳ ප්‍රකාශයට සහ මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශය සමඟ සැසඳීමේ දී රු.92,481 ක වෙනසක් පැවතුණි. | භාණ්ඩාගාරය විසින් ලබාදී ඇති උපදෙස් අනුව 2020 වසරේ ගිණුම් පියවීමේදී මාරු පත්‍රය මඟින් ඉවත් කර ඇති වත්කම් අපගේ සිගාස් වැඩසටහන තුළින් අපහරණය කර ඒවා නැවත 2021 වර්ෂයේ ආරම්භක ශේෂ ලෙස ගලපන බව. | දේපල, පිරියත හා උපකරණ නිවැරදි වටිනාකම මූල්‍ය ප්‍රකාශන තුල හා මූල්‍ය නොවන වත්කම් පිලිබඳ ප්‍රකාශනයෙහි දැක්විය යුතුවීම. |

**1.6.2 ලේඛන හා පොත්පත් පවත්වා නොතිබීම**

----------------------------------------------

දෙපාර්තමේන්තුව විසින් පහත දැක්වෙන ඇතැම් ලේඛන පවත්වා නොතිබුණු අතර, ඇතැම් ලේඛන විධිමත්ව හා යාවත්කාලීනව පවත්වා නොතිබුණු බව නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය විය.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | **ස්ථාවර වත්කම් ලේඛනය**<br>1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 502(2) ප්‍රකාර ස්ථාවර වත්කම් ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | ස්ථාවර වත්කම් ලේඛන තවදුරටත් පවත්වා ගෙන යාම අනිවාර්යය නොවන බව මාර්ගෝපදේශ අංක 06 හි 8 වන ඡේදයේ සදහන් වේ. එයට අනුකූලව වත්කම් සිගාස් වැඩසටහනට ඇතුලත් කර ස්ථාවර වත්කම් ලේඛනය පවත්වාගෙන යනු ලබන බව. | චක්‍රලේඛ හා මුදල් රෙගුලාසි විධිවිධාන ප්‍රකාරව ස්ථාවර වත්කම් ලේඛනය පවත්වා ගත යුතුවීම. |
| (ආ) | **ඇප ලේඛනය**<br>මුදල් රෙගුලාසි 891(1) ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් හා සේවකයන්ගේ තොරතුරු ඇතුළත් ඇප ලේඛනය යාවත්කාලීන කර නොතිබුණි. | අදාළ මුදල් රෙගුලාසිවලට අනුව ඇප ලේඛනයක් පවත්වාගෙන යනු ලබන බව හා ඇප තබා නොමැති නිලධාරීන් ඇප තැබීම සඳහා අවශ්‍ය කටයුතු සිදුකර ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව ඇප තැබිය යුතු නිලධාරින් පිළිබඳ ඇප ලේඛනය යාවත්කාලීන කළ යුතු බව. |
| (ඇ) | **වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනය**<br>මුදල් රෙගුලාසි 1647(ඉ) ප්‍රකාරව වාහන ලැයිස්තුගත කිරිමේ ලේඛනයක් පවත්වා නොතිබුණි. | වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් නිසි පරිදි පවත්වාගෙන යාම සඳහා අවශ්‍ය උපදෙස් ලබාදෙන ලද බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව වාහන ලැයිස්තුගත කිරීමේ ලේඛනයක් පවත්වාගත යුතුවීම. |
| (ඇ) | **ප්‍රසම්පාදන කමිටුවේ හා තාක්ෂණ ඇගැයීම් කමිටුවල පැමිණීමේ ලේඛනය**<br>රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහයේ 2.11.2 මාර්ගෝපදේශය ප්‍රකාරව පැමිණීමේ ලේඛන පවත්වා නොතිබුණි. | ප්‍රසම්පාදන හා තාක්ෂණික කමිටුවේ පැමිණීම සටහන් කරනු ලබන බව හා මෙම වසරේ සිට විධිමත් ලෙස පැමිණීමේ ලේඛණයක් පවත්වා ගෙන යනු ලබන බව. | රජයේ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංග්‍රහය ප්‍රකාරව කමිටුවේ ලේකම්වරයා විසින් පැමිණීමේ ලේඛනයක් පවත්වා ගත යුතුවීම. |

(ඉ) උප පත්‍රිකා පොත් ලේඛනය

| | | |
|---|---|---|
| මුදල් රෙගුලාසි 341 හි විධිවිධාන ප්‍රකාරව උප පත්‍රිකා ලේඛනයක් පවත්වා නොතිබුණි. | දැනට උප පත්‍රිකා පොත් ලේඛනයක් පවත්වාගෙන යනු ලබන නමුත් එය ජී.ඒ.එන්.20 ආකෘතිය ප්‍රකාරව පවත්වා ගෙන යාමට මෙම වසරේ සිට කටයුතු යොදා ඇති බව. | මුදල් රෙගුලාසි ප්‍රකාරව උප පත්‍රිකා පොත් ලේඛනය පවත්වා ගත යුතුවීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 වියදම් කළමනාකරණය**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

| **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|
| වැය විෂයයක මුළු ශුද්ධ ප්‍රතිපාදනයම ඉතිරි වී තිබූ අතර වැය විෂයයන් හතරක ශුද්ධ ප්‍රතිපාදනයෙන් සියයට 24 සිට සියයට 47 ක් දක්වා පරාසයක ප්‍රමාණයක් ඉතිරි වී තිබුණි. | කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් වැඩසටහන් නොපැවැත්වීම බව. | ඇස්තමේන්තු නිවැරදිව පිළියෙල කල යුතුවීම. |

**2.2 බැරකම් හා බැඳීම්වලට එළඹීම**

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | **විගණන නිරීක්ෂණය** | **ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම** | **නිර්දේශය** |
|---|---|---|---|
| (අ) | මෝටර් රථයකට අදාලව ගෙවිය යුතු රු.82,007 ක රක්ෂණ වාරිකය බැරකම් ප්‍රකාශයේ ඇතුළත් කර නොතිබුණි. | බැරකම් හා බැදීම් ලේඛණයට ඇතුලත් කළ යුතු බව පිළිගන්නා බව. | බැරකම් ප්‍රකාශයට සියළු බැරකම් ඇතුළත් කළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | භාණ්ඩාගාර මුද්‍රිතවල සඳහන් නොවූ එකතුව රු.398,915 ක් වූ බැරකම් 44 ක් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ බැරකම් පිළිබඳ ප්‍රකාශනයෙහි ඇතුළත් කර තිබුණි. | පසුව ලැබුණු වවුචර් මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කල බැරකම් පිළිබඳ ප්‍රකාශනයෙහි ඇතුලත් වී ඇති අතර භාණ්ඩාගාර මුද්‍රිතයේ ඇතුලත් වී නොමැති බව. | භාණ්ඩාගාර මුද්‍රිත සමඟ බැරකම් පිලිබඳ ප්‍රකාශය සැසඳිය යුතුවීම. |
| (ඇ) | මූල්‍ය ප්‍රකාශන සමඟ ඉදිරිපත් කළ බැරකම් පිළිබඳ ප්‍රකාශනයෙහි සඳහන් නොවූ එකතුව රු.122,169 ක් වූ බැරකම් 15 ක් භාණ්ඩාගාර මුද්‍රිතවල ඇතුළත් වී තිබුණි. | අපගේ පාලනයෙන් තොරව බැරකම් සිගාස් වැඩසටහනට ඇතුලත් වන බැවින් භාණ්ඩාගාර මුද්‍රිතවලට අනුව දෙපාර්තමේන්තුවේ බැරකම් ප්‍රකාශය සැසඳිම අපහසු බව. | එම |
| (ඈ) | වැය විෂයයන් 11 කට අදාලව ඉතිරි ප්‍රතිපාදන ඉක්මවා රු.3,020,146 ක බැරකම්වලට එළැඹ තිබුණි. | වාර්ෂිකව පුනරාවර්තනය වන සේවාවන් හෝ සැපයුම් සඳහා බැඳීම්වලට එළඹ ඇති අතර, බොහෝ විට දෙසැම්බර් මසට අදාල බිල්පත් ඊළඟ වසරේ ජනවාරි මස ලැබෙන බව. | ප්‍රතිපාදන ඉක්මවා බැරකම්වලට නොඑළැඹිය යුතුවීම. |

## 2.3 නීති, රීති හා රෙගුලාසිවලට අනුකූල නොවීම

නියැදි විගණන පරීක්ෂණවලදී නිරීක්ෂණය වූ නීති,රීති හා රෙගුලාසිවල විධි විධානවලට අනුකූල නොවූ අවස්ථා පහත විග්‍රහ කර දැක්වේ.

| | නිරීක්ෂණය | | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | නීති,රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම | | |
| (අ) | 2016 දෙසැම්බර් 29 දිනැති අංක 30/2016 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛයේ 3.1 හා 3.3 වගන්ති | දෙපාර්තමේන්තුව සතු වාහනවල ඉන්ධන දහනය වීම පිළිබඳ පරීක්ෂාවක් කර සටහන් පවත්වා ගෙන නොතිබුණි. | 2020 කොරෝනා වසංගත තත්වය මත මාස ගණනාවක කාල සීමාවක් තුළ කාර්යාල වසා තිබීමත් හා වාහන ධාවනය අඩුවෙන් සිදු වූ බව හා 2021 වසරේ ඉන්ධන දහනය වීමේ පරීක්ෂාවක් සිදු කිරීමට නියමිත බව. | චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුවීම. |
| (ආ) | 2018.01.24 දිනැති අංක 02/2018 දරන රාජ්‍ය පරිපාලන චක්‍රලේඛය | මානව සම්පත් සංවර්ධන සැලැස්මක් පිළියෙල කර නොතිබුණි. | මානව සම්පත් සැලැස්මක් පිළියෙල කිරීමට තොරතුරු නිලධාරීන් ගෙන් රැස් කර ගෙන තිබූ නමුත්, කොවිඩ් 19 වසංගත තත්ත්වය හේතුවෙන් මානව සම්පත් සැලැස්ම පිළියෙල කර අවසන් කිරීමට හැකියාවක් නොලැබුණු බව. | එම |

## 3. මෙහෙයුම් සමාලෝචනය

### 3.1 දැක්ම හා මෙහෙවර

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| දෙපාර්තමේන්තුව ආරම්භ වූ 1956 වර්ෂයේ සිට සමාලෝචිත වර්ෂය වන විට වර්ෂ 64 ක් ගත වී තිබුණ ද දෙපාර්තමේන්තුවේ මෙහෙවර අනුව ළමුන්ගේ අයිතිවාසිකම් ආරක්ෂා වන පරිදි විශ්ව ප්‍රඥප්තියට අනුකූලව ජාතික ප්‍රතිපත්තියක් සකස් කිරීම හා ඊට අදාළ නීති සම්පාදනය කිරීම කර නොතිබුණි. විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය සඳහා 2019 මාර්තු 06 වන දින කැබිනට් අනුමැතිය ලබාගෙන තිබුණ ද, එම ප්‍රතිපත්තිය විගණිත දිනය වූ 2021 මාර්තු 25 වන විටත් ක්‍රියාත්මක කර නොතිබුණි. | විකල්ප රැකවරණ ප්‍රතිපත්තිය පාදක කරගෙන ජනලේඛන හා සංඛ්‍යාලේඛන දෙපාර්තමේන්තුව හා ඒකාබද්ධ ළමා නිවාස ළමුන් පිළිබඳ සංගණනයක් පවත්වන ලදී. සංගණනයේදී අනාවරණය වන තොරතුරු පදනම් කරගෙන "ක්‍රියාකාරී සැලැස්මක්" සකස් කොට ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය සැලසුම් සකස් කර ඇතිබව. | මෙහෙවරට අනුකූලව ක්‍රියාකිරීම සඳහා ජාතික ප්‍රතිපත්තියක් සකස් කර ක්‍රියාත්මක කල යුතුවීම. |

### 3.2 සැලසුම් කිරීම

පහත සඳහන් නිරීක්ෂණය කරනු ලැබේ.

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව ක්‍රියාකාරී සැලැස්ම පිළියෙල කර නොතිබුණි. | 2021 වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම 2014 පෙබරවාරි 17 දිනැති අංක 01/2014 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව පිළියෙල කිරීමට කටයුතු කර ඇති බව. | චක්‍රලේඛයේ විධිවිධානවලට අනුකූලව කටයුතු කළ යුතුවීම. |

## 3.3 කාර්ය භාරයන් ඉටු නොකිරීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා දෙපාර්තමේන්තු කාර්යයන් සම්බන්ධීකරණය, සහාය වීම හා ප්‍රගතිය විමසීම දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයක් ලෙස හඳුනාගෙන තිබුණ ද 2018 වර්ෂයේ පළාත් පරිවාස කොමසාරිස්වරුන් ගේ රැස්වීම් 3 ක් හා 2019 වර්ෂයේ රැස්වීමක් පැවත්වීම පමණක් සිදුකර තිබුණි. | 2019.03.21 හා 22 යන දෙදින සියළුම පළාත් පරිවාස හා ළමාරක්ෂක සේවා කොමසාරිස් වරුන් හා පළාත්වල ජ්‍යෙෂ්ඨ පරිවාස නිලධාරීන් සඳහා දින 2ක පුහුණු වැඩසටහනක් පවත්වන ලද බව. | දෙපාර්තමේන්තුවේ කාර්යභාරයන් ඉටු කර ගැනීම වෙනුවෙන් කාර්යක්ෂමව ක්‍රියා කල යුතුවීම. |
| (ආ) | අවධානම් සහිත දරුවන් සඳහා ආරක්ෂණ සැලසුම් ක්‍රියාත්මක කිරීම සඳහා සමාලෝචිත වර්ෂය සඳහා රු.5,587,500 ක් වූ ප්‍රතිපාදිත මුදලින් සමාලෝචිත වර්ෂය අවසානයට දරුවන් 167 දෙනෙකු සඳහා රු.5,575,000 වැය කර තිබූ බව ප්‍රගති වාර්තා අනුව නිරීක්ෂනය විය. එහෙත් ආරක්ෂණ සැලසුම් සඳහා කරනු ලැබූ ඉල්ලීම් විධිමත්ව ලේඛනගත කර නොතිබීම, දරුවන් තෝරා ගැනීමේ නිශ්චිත ක්‍රමවේදයක් සකස් කර නොතිබීම, ප්‍රාදේශීය ලේකම් කාර්යාල වෙත යවන ප්‍රතිපාදන නියමිත කාලය තුළ නියමිත කාර්යය සඳහා යොදා ගනු ලබන බවට පසුවිපරම් ක්‍රියාවලියක් නොතබීම යනාදී දුර්වලතා පැවතුණි. | ආරක්ෂණ සැලසුම් සඳහා ප්‍රතිපාදන ලබාදීමේදී නිවැරදිව සකසන ලද සැලසුම් ලේඛණගත කර කමිටුව වෙත ඉදිරිපත් කරන ලදි. අඩුපාඩු රහිත සැලසුම් සියල්ල දත්ත පද්ධතියට ඇතුලත් කර ඇති බවත්, ආරක්ෂණ සැලසුම් සඳහා ප්‍රතිපාදන ලබාදීමට දරුවන් තෝරා ගැනීමේදී විධිමත් දෙපාර්තමේන්තුගත කමිටුවක් මගින් සිදුකරනු ලබන බවත් ලැබෙන ප්‍රතිපාදන සීමිත බැවින් අදාල ළමා හිමිකම් ප්‍රවර්ධන නිලධාරීන් සමඟ සාකච්ජා කිරීමෙන් පසු ප්‍රමුඛගත කර කඩිනමින් මැදිහත් විය යුතු සැලසුම් සඳහා ප්‍රමුඛතාවය ලබා දෙන බවත් සහ දිස්ත්‍රික් නිලධාරීන් විසින් මාසිකව දෙපාර්තමේන්තුව වෙත ප්‍රගතිය වාර්තා කරන බව. | නිසි ක්‍රමවේදයක් මත පළාත් කොමසාරිස්වරුන්ගේ කාර්යභාරයන් පිළිබඳව පසුවිපරම් කටයුතු සිදුකළ යුතුවීම. |

| | | | |
|---|---|---|---|
| (ඇ) | දෙපාර්තමේන්තුවේ ප්‍රධාන කාර්යභාරයක් වන 1939 අංක 48 දරන ළමයින් හා යෞවනයින් පිළිබඳ ආඥා පනත සංශෝධනය කිරීම හා ළමා නිවාස ආඥා පනත සංශෝධනය කිරීම සමාලෝචිත වර්ෂය දක්වාම නිම කර නොතිබුණි. | ළමයින් හා යෞවනයින් පිළිබඳ ආඥා පනත සංශෝධනය කිරීම අවසන් අදියරයේ පවතින බව. | කඩිනමින් සංශෝධන කටයුතු නිම කළ යුතුවීම. |
| (ඈ) | විගණනය වෙත ඉදිරිපත් කළ තොරතුරු අනුව 2015 වර්ෂයේ සිට 2020 වර්ෂය දක්වා දෙපාර්තමේන්තුව වෙත වාර්තා වූ ළමා අපයෝජන පැමිණිලි 61,238 කින් පැමිණිලි 17,732 ක් සඳහා කෙටිකාලීන විසඳුම් ද පැමිණිලි 10,577 ක් විසඳුම් සඳහා වෙනත් ආයතන වෙත යොමු කිරීම හා පැමිණිලි 485 ක් වෙනත් ලෙස දක්වා තිබුණි. පැමිණිලි සඳහා ලබා දුන් විසඳුම්වල ප්‍රගතිය විමසීම හා පසුවිපරම් කිරීම දෙපාර්තමේන්තුව විසින් සිදු කර නොතිබූ අතර වැඩි අවධානය යොමු කළයුතු දිස්ත්‍රික්ක, අවධානය යොමු කළයුතු ක්ෂේත්‍ර හඳුනාගැනීමක් සිදුකර නොතිබුණි. | පසු විපරම් කටයුතු දිස්ත්‍රික් ලේකම්ගේ අධීක්ෂණය යටතේ දිස්ත්‍රික් නිලධාරීන් විසින් සිදු කරනු ලැබේ. විශේෂ අවස්ථාවලදී අවශ්‍යතාවය අනුව ප්‍රධාන කාර්යාලය විසින් පසුවිපරම් සිදු කරන බව. | දෙපාර්තමේන්තුව විසින් පැමිණිලි විසඳීම පිළිබඳ පසුවිපරම් කළ යුතුවීම. |

## 3.4 වත්කම් කළමනාකරණය

---------------------------

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| | -------------------- | ----------------------------- | ---------- |
| (අ) | 2017 වර්ෂය තුළ අවස්ථා 3 කදී රු.418,225 ක් වැය කර අලුත්වැඩියා කරන ලද මෝටර් රථයක් එම වර්ෂයේදීම ධාවනයෙන් ඉවත් කර ළමා පුහුණු හා උපදේශන මධ්‍යස්ථානයක නිෂ්කාර්යව රඳවා තිබුණි. | අදාල වාහනය අපහරණය කිරීමට අවශ්‍යය ඉදිරි කටයුතු මේ වන විට සිදු වෙමින් පවතින බව. | අලුත්වැඩියා කර භාවිතයට ගත හැකි වාහන පමණක් අලුත්වැඩියා කලයුතු වීම. |

| | | | |
|---|---|---|---|
| (ආ) | සමාලෝචිත වර්ෂය තුළ අපහරණය කරන ලද වෙනත් යන්ත්‍ර හා උපකරණ අයිතම 08 ක් මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ අපහරණයන් යටතේ දක්වා නොතිබුණි. | 2022 වන විට මූල්‍ය නොවන වත්කම් ගිණුම්ගත කිරීමට අදාල ගැටළු නිරාකරණය කිරීමට කටයුතු කරන බව. | මූල්‍ය නොවන වත්කම් පිළිබඳ ප්‍රකාශයේ අපහරණය කරන ලද වත්කම් ඇතුළත් කළ යුතුවීම. |

## 4. මානව සම්පත් කළමනාකරණය

| විගණන නිරීක්ෂණය | ගණන්දීමේ නිලධාරීගේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 2020 දෙසැම්බර් සිට කොමසාරිස් තනතුර ඇතුළු ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරු 02 ක් පුරප්පාඩුව පැවතුණි. නීති නිලධාරී තනතුර සඳහා දෙපාර්තමේන්තුවට කිසිදු නිලධාරියෙකු බඳවා ගෙන නොතිබුණි. | නීති නිලධාරී තනතුර සඳහා අයදුම්පත් කැඳවා ඇතිබව. | අත්‍යවශ්‍ය වන ජ්‍යෙෂ්ඨ මට්ටමේ තනතුරුවල පුරප්පාඩු කඩිනමින් පිරවිය යුතුවීම. |